

ඇත්ත කෙටි කතාව

# කලුතර 'සුදු සදේ කලු වළා'



**මා** කොල්ලුපිටියේ රැකෝර්ඩ් බාරය කරන අතරතුර වූ අමතක නොවන සිදුවීම් ගණනාවකි. බැරිවැඩ කරන්නට ගොස් අමාරුවේ වැටීම, අත්තිකාරම් නොගෙන වැඩ කොට අතින් පාඩු විඳගැනීම, කපටින්ට අහුවී බඩුමුට්ටු අහිමිවීම ආදිය ඉන් කීපයකි. මේ තවත් එකකි.

දිනක් කඩිමුඩියේ කොල්ලුපිටියේ අපේ සාප්පුවට ගොඩනැගුණේ තරුණ භික්ෂූන් වහන්සේ නමකි. පියකරු සිනහවකින් සැරසුණු උන්වහන්සේ කලුතර පන්සලක නමක් කියා එයට ආධාර වශයෙන් සිංහළ චිත්‍රපටියක් පෙන්වීමට අවශ්‍ය බැවින් අපට එය කළ හැකිදැයි විමසූහ. එකල අපේ සිරිත වූයේ කිසිවකට බැහැයි නොකියා හඳටයෑමේ පටන් ඕනෑම වැඩක් බාර ගැනීමය. මගේ සහකරු චන්ද්‍රා කතාකරන්නේ ඕනෑම දේක කෙළපැමිණි එක්ස්පර්ට් කෙනෙකුගේ විලාශයෙනි. එසේ හැසිරීමට මා මැලිවූවත් මට ඉස්සරවෙලා කවුරු හෝ ආ විගස පැනලා කට දමන්නේ චන්ද්‍රා ය. " අපෝ හාමුදුරුවනේ ඕක මහ වැඩක් නෙවෙයි... අපි දැන් පන්සල් ගණනාවකම පෙන්නලයි ඉන්නේ... මේ අනිද්දා දෙමටගොඩ නිග්‍රෝධාරාමෙ අපි හතර මහ නිධානෙ පෙන්නනවා..."
ඔහු කීවේ අලි කෙප්පයකි. ප්‍රොජෙක්ටරයක් අප ළඟ තිබුණත් තවම අප කිසිම චිත්‍රපට යක් කොහේවත් පෙන්නලා නැත. කොටින්ම ඒ ප්‍රෙජෙක්ටරය වැඩ කරනවාද කියා වත් අපි නොදන්නෙමු.

චිත්‍රපට සංස්ථාවෙන් මිලිමීටර් 35 චිත්‍රපට පිටපතක් නොමිලයේම ලැබෙන බව හාමුදුරුවන් කී නිසා අපි ඒ කියූ දිනයට එහි ගොස් චිත්‍රපටය තිරගත කරන්නට බාරගතිමු. ගාස්තුවේ සම්පූර්ණ මුදල එදාට ගෙවන බව හාමුදුරුවෝ කීහ. එයට කමක් නැත.

නියමිත දිනයේ සවස 2 ට පමණ අකුලා සූට්කේසයක දමාගත හැකි සිනමා ප්‍රොජෙක්ටරයත්, අවශ්‍ය වෙනත් ආම්පන් නත්, ඇතුලුව සියළු දේ වලින් සන්නද්ධව කලුතර බලා යන්නට බස් රථයකට ගොඩ වුනෙමු. මා සමග මගේ සහායක චන්ද්‍රාද වීය. කලුතර සහ වාද්දුව අතර අපට කලින් දන්වා තිබූ එක්තරා හන්දියක බසය නවත්වන විට ස්වාමීන් වහන්සේ ද, තව පිරිසක් ද සිටින ආකාරය දැක ඉතා සතුටට පත්වීමු.

බසයෙන් බට විගස අපේ බඩු බාහිරා දිය ඔසවා ගත්තේ ඔවුන් ය. ඔවුන් අප ඉමහත් හරසරින් පිළිගත් බව පෙනිණ.
ඉමහත් හරසරින් පිළිගත් බව පෙනිණ.
ස්වාමීන් වහන්සේගේ මුහුණෙහි සිනහව ඉතිරෙමින් තිබිණ. පෙරටුව ගිය හාමුදුරු- වන් සහ ඒ පිරිස සමග පටු පාරක් දිගේ අපි පිය නැගුවෙමු. එදින සන්ධ්‍යාවේ පන්සලේ චිත්‍රපටයක් පෙන්වන බවට පාර දෙපස පෝස්ටර් ගසා තිබුණි. එයින් මා වටහා ගත්තේ එදින අප තිරගත කරන්නට යන්නේ රොබින් තම්පෝගේ නිර්මාණයක් වන **සුදු සදේ කලුවලා** චිත්‍රපටය බව ය.

අප වෙනුවෙන් රසකැවිලි සහිත තේ පැන් සංග්‍රහයක් වීය. ඉතා සතුටින් එය භුක්ති වින්ද අපි පන්සලට නුදුරින් වූ බණ මඩුවේ කෙළවරක චිත්‍රපටය පෙන්වීමට අවශ්‍ය ආම්පන්න දිගහරිමින් අමුණමින් සවස් වන තෙක් ගත කළෙමු.

දැන් ඇඳිරි වැටීගෙන එයි. බණමඩුව සහ පන්සල් වත්ත ජනයාගෙන් පිරී ඉතිරී ඇත. අපි චිත්‍රපට දර්ශණය ආරම්භ කිරීමට සූදානම්ව ඒ බව හාමුදුරුවන්ට කීවෙමු. උන්වහන්සේ අපේ ශබ්ද විකාශන යන්ත්‍රය මාර්ගයෙන් චිත්‍රපටය තිරගත කිරීමේ පරමාර්ථය සහ විහාරස්ථානයේ ගොඩනැගිලි අරමුදල ගැනද ජනතාව දැනුම්වත් කළහ. සන්සුන්ව චිත්‍රපටය රසවිඳින ලෙස ද ආයාචනා කළහ. චන්ද්‍රා ප්‍රෙජෙක්ටරය ක්‍රියාත්මක කළේය. **රොබින් තම්පෝ නිශ්පාදනයක් - සුදු සදේ කළුවළා** - යනුවෙන් තිරයේ පතිතවෙත්ම නරඹන්නන් ගෙන් අත්පොලසන් නාදයක් ආවේය. ඒ සමග විසිල් පාරවල් ද ඇසිණ.

විනාඩි දහයක් පමණ ඉතා හොඳින් පැහැදිලිව චිත්‍රපටය දර්ශණය වීය. එක් වරම ඩෝංගා යමක් පුපුරණ ශබ්දයක් ඇසිණ. ඒ සමගම ශාලාව අඳුරු විය. ප්‍රොජෙක්ටරයේ එළියද නිවී ගියේය. වුණු දේ මට සැනින් වැටහිණ. ප්‍රොජෙක්ටරයේ බල්බය පිළිස්සී පිපිරී ඇත. එයට සුළං වදින පංකාව ක්‍රියාවිරහිත වුණොත් එය සිදුවනබව මම දැන සිටියෙමි. ශාලාවෙන් හීන් හූ හඬක් ආවේය. කඩිමුඩියේ දුවගෙන ආ හාමුදුරුවන්ට මා පැවසූයේ පොඩි වැරැද්දක් බවත් එය හරිගස්සන්නට මඳ වේලාවක් අවශ්‍ය බවත් ය.

හාමුදුරුවෝ අප ළඟට පැමිණ මයික් එක ගෙන " පින්වතුනි නිශ්ශබ්ද වන්න... සුළු කාර්මික දෝෂයක්..තව ඉතා සුළු වේලාවකින් ඔබට යළිත් චිත්‍රපටය නැරඹිය හැකියි " කීහ. එහෙත් අතිරේක බල්බයක් අප ළඟ නැති බව මා මෙන්ම මගේ සහා යකයාද දනී. ලෝකයේ කිසිම තැනක මේ තාක් පිච්චිච්ච බල්බයක් යළිත් පත්තු වී ඇති බවක් අප අසා නැතත් අපි ප්‍රොජෙක්ටරය අතපත ගාමින් පිච්චිච්ච බල්බයට යළි යළිත් තට්ටුකරමින් එය පණ ගන්වන්නට නිසරු වෑයමක යෙදුනෙමු. හාමුදුරුවන්ට වඩා අපට දාඩිය දමා ඇත. ඒ අතරේ හූ හඬ ද " ඕයි...! ඕක අද පෙන් නන්නෙ නැද්ද...?"යනුවෙන් කෑකෝ ගසන ශබ්දය ද ඇසේ. බීගත් දෙදෙනෙක් විත් අපට පහරදෙන්නට උත්සාහ කරති. හාමුදු රුවෝ සහ අනෙක් දායක පිරිස ඔවුන් වළක්වමින් අප වහ ගෙන සිටිති. හූ හඬ නොකඩවා ඇසේ. පිරිස නොසන්සුන් ය.

" මහත්තෙයෝ.... ඕක අද හරියන්නෙ නෑ... ඔන්න ඕකත් අකුලගෙන පණ බේර ගෙන ඔතනින් යන්න...."

එය කීවේ කවුදැයි මතක නැත. අප දෙදෙනාත් බඩුමුට්ටු ටිකත් පන්සලේ ගේට්ටුවෙන් ඉවතට විසිවුණා යයි කීවොත් එය බොරුවක් නොවේ. ප්‍රොජෙක්ටර් බඩු ටිකත් කරේ ගසාගෙන සැතපුම් බාගයක් පමණ අතුරුපාරවල් දිගේ කට්ට කරුවළේ වලවල් වල වැටෙමින් හතිදාගෙන ගාලු පාරට ආවෙමු. අපේ වාසනාවට එවෙලේ ගාල්ලේ සිට කොළඹ බලා යන බසයක් ආවේය. හුස්මක් ගත්තේ එයට නැගුණාට පසුවය. ඩ්‍රයිවර්ගේ ආසනය අසළ අපේ බඩුමුට්ටු තබා පසුපසට ගොස් හිඳගතිමු.

" ෂහ්! බස් ගාස්තුව වත් හම්බවුණේ නැනේ..." චන්ද්‍රා මැසිවිලි කියයි. මම නිහඬව වෙච්ච දේ ගැන කල්පනා කළෙමි. කොල්ලුපිටියෙන් බහින තැනට විත් අපේ බඩු ටික ගන්නට ඉස්සරහට ගිය විට ප්‍රොජෙක්ටර් බෑගය කවුදෝ මගියෙක් පටවන ලද විසාල වට්ටක්ක ගෝනියකට යටවී තිබුණේය. ප්‍රොජෙක්ටරය කෑලිවලට කැඩී ඇති බව දැක්කේ සාප්පුවට ගොස් එය විවෘත කළ විටය. ඒකෙන් පෙන්වූත්, එසේම අපගේ ප්‍රථම මෙන්ම අවසාන චිත්‍රපට දැක්මත් **සුදු සඳේ කලුවලා** ය.

ඒ කෙසේ වෙතත් මහාචාර්‍ය සුනිල් ආරියරත්නයන්ගේ නිගමනයට අනුව ශ්‍රීලංකාවේ පළමු වරට සිංහළ ගීත කැසට් පටියක් නිෂ්පාදනය කළේ මා බවය. මූල්‍ය අවහිරතා නිසා එය ව්‍යාපාරයක් බවට පත්කරගන්නට මට නොහැකි වීය. මේ බව එතුමා පසුගිය දා කොළඹ පැවති රැස්වීමක ඔහුගේ දේශන යේදී සඳහන් කළ බව ආඩම්බරයෙන් යුතුව පවසමි.

♦ නීතිඥ අනුර හෑගොඩ

# අහෝ ! ජාතික කොඩියට ගිය කල !

**ජා**තික කොඩිය යනු දේශයක ජාති යක පෞඨත්වය ලොවට විදහා දක් වන සංකේතයයි. එයට ජනතා හදව තෙහි ඉහළම ස්ථානය හිමිවිය යුතුය. ජාතික කොඩිය සුළුවට සලකා බාල්දු කළ යුතු වස්තුවක් නොවේ. ලොව ඇති සෙසු ජාතික කොඩි අතුරින් ශ්‍රීලංකාවේ සිංහ කොඩියට අද්වීතීය තැනක් අතීතයේ පටන් මේ දක්වාම හිමිව ඇති බව අපි දනිමු. අපේ දේශ යට අප දක්වන භක්තිය හා ප්‍රණාම ය ඒ හා සමානව අපේ ජාතික කොඩියට දැක්වීම දේශප්‍රේමයේම ඒක් වැදගත් සළකුණකි. කෙනෙකු ජාතික කොඩියට කරන ගෞරවය ඔහු තම අනන්‍යතාවට කරන ගෞරවයයි.


ජාතික කොඩිය තිබෙන්නේ තුවායකට ගෙන මූණ පිහදාන්නට නොවේ. කෑම මේසෙට එළා ඉඳුල් හලන්නට නොවේ. දියරෙද්දට අඳින්නට නොවේ. අඳින්නට නැතුව නිර්වස්ත්‍රව සිටින ගෑණුන්ට පිරි මින්ට හෙලුව වහගන්නට නොවේ. රෙදි පිළි බහුල මෙකල අඳින්නට ඕනෑ තරම් රෙදි ඇත. ඒවා ගන්නවා මිසක සිංහ කොඩිය ඇඳුම් මෝස්තරයකට ගතයුතු නොවේ. ජාතික කොඩියට තුට්ටුවක සැලකීමක් නැති නරුමයින් එය ළඟදිම ඔවුන්ගේ ගෙවල්වල ඉස්තෝප්පුවේ එළිපත්තේ කකුල පිහිදාන්නට පාපිස්සට උඩින් එලුවොත් පුදුමවිය යුතුනැත. අමන ලංකාවේ හැටි එහෙම ය.

♦ වෙනුර





# Three Wise Monkeys
# පණ්ඩිත වානරයින් තිදෙන




**මේ** රූපයෙන් දැක්වෙන්නේ වඳුරෝ තුන් දෙනෙක්. කට වහ ගෙන ඉන්න වඳුරගේ නම **ඉවාසාරු**. ඇස් දෙක වහගෙන ඉන්න වඳුරගෙ නම **මිසාරු.** කන් දෙක වහගෙන ඉන්න එකා **කිකා සාරු.** මේ වඳුරෝ ජපානයේ සංකල්පයක්. මේ නම් පවා ජපන්. මේ වානර සංකල්පය දැන් ලොව පුරාම ප්‍රචලිතයි. බටහිර රට වල ඉංග්‍රීසියෙන් මෙය හඳුන්වන්නෙ **Three Mystic Apes** කියලා. මේ වඳුරු තුන් දෙනාගේ ඉරියව් වලින් පෙන්නන්නෙ ලොකු ආදර්ශයක්. මෙයින් කියන්නෙ මේකයි. මම නරක දෙයක් කියන්නෙ හෝ කතාකරන්නෙ නැහැ. මම නරක දෙයක් දකින්නෙ නෑ. මම නරක දෙයක් අහන්නෙ නෑ. **(Speak no evil, See no evil, Hear no evil )** තවත් විදියකට අර්ථ කථනය කරන්නත් පුළුවන්. නරක දෙයක් දකින්න, අහන්න, කියන්න මට සිද්ධවෙන්න එපා යනුවෙන්.

කොහොම වුනත් මේ නැණවත් පණ්ඩිත වඳුරෝ තුන් දෙනා ගැන දැන් ලෝකෙ කවුරුත් වගේ දන්නවා. එංගලන්තෙ ඉංග්‍රීසි අය මේ වානර සංකල්පයට තේරුමක් දීලා තියෙන්නෙ ටිකක් වෙනස් විදියට බව ඔවුන් මෙය එදිනෙදා ව්‍යවහාරයට යොදන ආකාරයෙන් පෙනෙනවා. යමක් කරන්න පුළුවන් අය, යමකින් කර ඇරලා යනකොට හරියට පණ්ඩිත වඳුරෝ තුන්දෙනා වගේය කියලා කියනවා. වගකීමක් පැහැර හරින අය, කරදර වෙන්න කැමති නැති අය, ඇඟ බේරගන්න හදන අය, දැක්කම මේ වඳුරු කතාව ගන්නවා උපමාවට.

මේ වඳුරු උපමාව ලංකාවට හොඳට ගැලපෙනවා. ලංකාවෙ සිද්ධවෙන බොහෝ දේවල් වලදි එහේ ඉන්න යමක් කරන්න පුවන් බලවත් අය පවා අහක බලන්නෙ, "අනේ අපි ඕවට ගෑවෙන්න කැමති නෑ" කියන අදහසින්. මට මේක මතක් වුණේ මේ පහුගිය දා කොළඹ ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගිය 'ප්‍රෝඩා පන්සලක් ' ගැන විස්තර පුවත්පත්වල කියවන්න ලැබුණු වෙලාවෙ. (පන්සල කිව්වට ඒක පන්සල් කියන වචනයටත් නිගාවක් දෙන තැනක්) සල්ලි වලට මාර්ග පළ, රහත් භාවය අරන්දෙන තැනක්. ඒ තැන අවුරුදු ගණනක් තිස්සේ පවත්වාගෙන ගියේ කවුරුත් දැනුවත්ව. සම්පූර්ණයෙන්ම බෞද්ධ දර්ශනය විනාශකරන තැනක්. ඒත් කිසිම ඇක්ෂන් එකක් ගන්න කෙනෙක් ලංකාවෙ හිටියෙ නැහැ. බොහොම සුළු පිරිසක් විරෝධය පෑවට වැඩක් නැහැ. කවුරුත් අහන්නෙ "කෝ මේ බුද්ධ ශාසන අමාත්‍යංශයක් කියලා එකක් තියනව නේද? මොකක්ද ඒකෙ ඉන්න යක්කු කරන්නෙ? කෝ මේ ලංකාවෙ ත්‍රෛනිකායෙ නායක හාමුදුරුවරු? ඇයි ඒ අය කිසිම ගානක් නැතුව අහක බලාගෙන ඉන්නෙ?"

එක පැත්තකින් අර විදියට හොරු බුද්ධාගම විකෘති කරනවා. තවත් යොහෝව සාක්ෂිකාරයො, නැවත ඉපදුණු ක්‍රිස්තියානිකාරයො ගම් නියම්ගම් වල ඇවිද ඇවිද බෞද්ධ පවුල් පිටින් ආගමට හරව ගන්නවා. ලංකාව කියන්නෙ තනිකරම පාලු අම්බලමක්. බලන්න හොයන්න කෙනෙක් නැහැ. පාළු අම්බලමෙ වළං බිඳින්න කාගෙන් තහනමක්ද? මේ සාසනේ රකින්න ඉන්නවයි කියන අය අර පණ්ඩිත වඳුරෝ තුන්දෙනා වගේ තමයි. කතා කරන්නෙ නෑ... කට වහගෙන ඉන්නෙ. වෙන දේවල් පේන්නෙ නෑ... ඇස් වහගෙන ඉන්නෙ. මොකවත් ඇහෙන්නෙ නෑ.... කන්දෙක වහගෙන ඉන්නෙ. ඒ වගේම ඇහුවොත් කියන්නත් ලේසියි, මට ඇහුණේ නෑ මං දැක්ක නෑ කියලා. ඒ තමයි ලංකාවෙ හැටි. දැක්කත් නොදැක්ක වගේ ඉන්නවා. ඇහුණත් නෑහුණා වගේ ඉන්නවා. කියන්න හිතුනත් නොකියා කට වහගෙන ඉන්නවා. ඒ තමයි සිංහළ බෞද්ධ ආකල්පය.

සිංහළ බෞද්ධයා ගැන රජය බලාවි කියලා හිතන්න බෑ. රජයට තියෙන්නෙත් අර දෙවෙනුවට කිව් වඳුරු ආකල්පය. සුළු ජාතීන් තරහ කරගන්න කැමති නැහැ ඡන්ද ටික නැති වෙනවට. නායක හාමුදුරුවරු ක්‍රියාත්මක වෙන්නෙ නැහැ රජය තරහ කර ගත්තොත් විහාරයට ලැබෙන අනුග්‍රහය නැති වෙන හන්දා.

මට දැන් මතක් වෙනවා සුනිල් ලියූ නන්දා මාලිනීගෙ ගීතයක්. ඒක මෙතෙන්ට හරියටම හරි. ඒ පදවැල මෙහෙමයි.....
" බුදු හිමියන්ටත් කලියුගයේ....දෙවියන්ගේ පිහිටයි......"

♦ වෙලේගෙදර රාළ London